# විභාග - විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

**තාක්ෂණ/ කාර්මික විද්‍යාලයන්හි පැවැත්වෙන පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2027**

1. මෙම නිවේදනයේ සඳහන් තාක්ෂණ / කාර්මික විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා සඳහා සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ සුදුසුකම් හා කුසලතාවයන් සැලකිල්ලට ගෙන පාඨමාලා සඳහා සිසුන් බඳවා ගනු ලැබේ.

2. මේ පිළිබඳ විස්තර www.dtet.gov.lk වෙබ් අඩවියෙහි පළකර ඇති අතර අයදුම්පත්‍රය එම වෙබ් අඩවිය හරහා හෝ mis.dtet.gov.lk මගින් මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කළ හැකිය. පාඨමාලා සඳහා අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කිරීමට කාරුණික වන්න. එසේ නොහැකි අවස්ථාවන්හිදී පහත පරිදි කටයුතු කරන්න. මෙම දැන්වීමේ දක්වා ඇති "ආදර්ශ අයදුම්පත්‍රයට" අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක අදාළ අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර 2026/12/04 වැනි දින හෝ ඊට පෙර අදාළ තාක්ෂණ / කාර්මික විද්‍යාලයේ අධ්‍යක්ෂ / විදුහල්පති වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. නැතහොත් අදාළ විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන අංශයට පැමිණ භාර දීමට අවස්ථාව ඇත. NVQ 5/6 පාඨමාලා සඳහා අයදුම්පත් යොමුකිරීම මාර්ගගත ක්‍රමයට පමණි.

   ***වැදගත්:-*** අයදුම්පත් මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට හෝ පුද්ගලික ලිපිනයකට යොමු නොකරන ලෙසට අයදුම්කරුවන් හට උපදෙස් දෙනු ලැබේ.

3. අයදුම්පත යොමු කරන කවරයෙහි වම්පස ඉහළ කෙලවරෙහි ඉල්ලුම් කරන පාඨමාලාවේ නම හා පාඨමාලා කේතය යොදන්න. එක් එක් පාඨමාලා සඳහා වෙන වෙනම අයදුම්පත් යොමු කළ යුතු ය.
   උදා. ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (කර්මාන්ත ජලනල ශිල්පී) - ECC 82

4. පාඨමාලා සම්බන්ධ වැඩිදුර තොරතුරු වෘත්තීය මාර්ගෝපදේශන අංශයේ 011-2348893 / 0711997111 යන දුරකථන අංක ඇමතීමෙන් හෝ www.dtet.gov.lk යන වෙබ් අඩවියෙන්ද මේ සමඟ ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන් වල දුරකථන අංක වලට ඇමතීමෙන් ද ලබාගත හැක.

5. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, පාඨමාලාවේ පුරප්පාඩු පවතී නම් පමණක් සලකා බලනු ඇත. ලැබෙන අයදුම්පත් අතරින් පාඨමාලා සඳහා සිසුන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සියලු තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන් වල එකම කාල සීමාවක් තුළදී පවත්වනු ලැබේ.

6. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 4, 5 සහ 6 මට්ටමේ සියලුම පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා කර්මාන්තගත පුහුණුව අනිවාර්ය වේ. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක NVQ Circular :- 05/2022 ට අනුව කර්මාන්තගත පුහුණුව සිදුකරනු ලැබේ.

   I. සියලුම ඩිප්ලෝමා මට්ටමේ (NVQ මට්ටම් 05 හා 06) පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් 03/04 පමණක් පවත්වනු ලැබේ.
   II. භාෂා පාඨමාලා හැර සියළුම NVQ මට්ටම් 03 / 04 පාඨමාලා සිංහල / දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ.

7. පාඨමාලාවල ස්වභාවය, ඒ ඒ පාඨමාලා සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම්, එම පාඨමාලා පැවැත්වෙන විද්‍යාල සහ පාඨමාලා පැවැත්වෙන භාෂා මාධ්‍යය මෙම දැන්වීමේ අවසානයේ දක්වා ඇති පාඨමාලා පිළිබඳ ලේඛනයෙහි අඩංගු බැවින් එම ලේඛනය කෙරෙහි සියලුම අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ. තාක්ෂණ / කාර්මික විද්‍යාලවල තැපැල් ලිපිනයන් හා දුරකථන අංක ද එම ලැයිස්තුවේ සඳහන් වේ. මෙම අයදුම්පත්‍රය සමඟ සුදුසුකම් වල සහතිකපත් හෝ සහතිකපත්‍ර වල ඡායාපිටපත් ඉදිරිපත් කිරීමෙන් වලකින්න. විද්‍යාලය හෝ පාඨමාලාව මාරුකිරීම සඳහා පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

8. සියලුම අයදුම්කරුවන් 2026/12/04 දිනට වයස අවුරුදු 16 සම්පූර්ණ වී තිබිය යුතු ය.

9. සියලුම පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වන සිසුන්ගෙන් පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ.

   NVQ මට්ටම් 3 හා 4 පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේදී පාඨමාලා සඳහා රු 1500/= ක ලියාපදිංචි ගාස්තුවක් හා NVQ මට්ටම් 5 හා 6 පාඨමාලා හා භාෂා ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේ දී රු. 2500/= ක ලියාපදිංචි ගාස්තුවක් අය කරනු ලැබේ.

10. අර්ධ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියලුම සිසුන්ගෙන් පහත සඳහන් පරිදි පාඨමාලා ගාස්තු අය කෙරේ.

    I. සමාසික වශයෙන් වර්ගීකරණය කරන ලද ඩිප්ලෝමා පාඨමාලා සඳහා එක් සමාසිකයකට රු.25,000/- මුදලක් ගෙවිය යුතු ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

II. පාඨමාලා කාලය වසරක් දක්වා වන පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු.30,000/- කි.

III. පාඨමාලා කාලය හයමාසික පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු.20,000/= කි.

IV. පාඨමාලා කාලය මාස 6ට අඩු පාඨමාලා සඳහා මුළු පාඨමාලා ගාස්තුව රු.15,000/- කි.

ඉහත පාඨමාලා ගාස්තු වාරික දෙකකින් ගෙවිය හැක. ප්‍රථම වාරිකය එම පාඨමාලා ගාස්තුවෙන් අඩක් (1/2) පාඨමාලාවට ලියාපදිංචි වීමේ දී ගෙවිය යුතු අතර, ඉතිරිය පාඨමාලාව ආරම්භ වී හය මාසයක් තුළ ගෙවා අවසන් කල යුතු ය. අවසන් විභාග හෝ ඇගයීම් සඳහා පෙනී සිටීමට පෙර ශිෂ්‍යයා විසින් සම්පූර්ණ පාඨමාලා ගාස්තු ගෙවා අවසන් කළ යුතු ය.

11. මෙම සියලුම ගෙවීම් GOVPAY හරහා සිදුකළ යුතු අතර වැඩිදුර විස්තර අපගේ වෙබ්අඩවියට (www.dtet.gov.lk) පිවිසීමෙන් ලබාගත හැක.

12. උසස් පෙළ විභාගයෙන් විෂයයන් 3ක් සමත් වී තිබීම යනු අදාල විෂය කාණ්ඩයේ ප්‍රධාන විෂයයන් 3ම සමත් වීම වේ.

13. අයදුම්කරුවන් තෝරාගනු ලබන්නේ අදාළ විෂය දැනුම සහ පාඨමාලාව පැවැත්වෙන භාෂා මාධ්‍යයෙන් සන්නිවේදනය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මතය. අයදුම්පත් වැඩි ප්‍රමාණයක් ඇති විට විද්‍යාලය විසින් ලිඛිත විභාගයකින් තෝරා ගැනීමට කටයුතු කරනු ඇත.

14. මෙම අයදුම්පත්‍රය සමඟ සුදුසුකම් වල සහතිකපත් හෝ සහතිකපත්‍ර වල ඡායාපිටපත් ඉදිරිපත් නොකළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය හා පිළිගත හැකි ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු අතර අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛනවල සත්‍යතාව පිළිබඳව සම්පූර්ණ වගකීම ඔහු හෝ ඇය විසින් දැරිය යුතු ය. වංචනික හෝ වෙනස් කිරීම් සහිත ලිපි ලේඛන ඉදිරිපත් කරන හෝ අයදුම්පතෙහි සඳහන් කරුණු සනාථ වන සේ ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

15. තෝරාගනු ලබන පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් සඳහා පහත දැක්වෙන ප්‍රතිලාභ හිමි වේ.

I. පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට නිපුණතා සිසු සවිය යටතේ මාසිකව රු 7,500/- උපරිමයකට යටත්ව පැමිණීමේ දීමනාවක් හිමි වේ.

II. පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන් සඳහා ලංගම හා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර අවශ්‍යතාව මත ලබා ගත හැකිය.

III. පාඨමාලා පැවැත්වීමට, අවශ්‍යතාවය පරිදි පුහුණු ද්‍රව්‍ය හා උපකරණ රජය විසින් නොමිලේ සපයනු ලැබේ.

16. තෝරාගත් පාඨමාලාවන් සඳහා විශේෂ අනුමැතිය මත අවශ්‍ය වුවහොත් මාර්ගගත ක්‍රමයට දේශන පැවැත්වෙනු ඇති අතර එය අධ්‍යයන කාලයට අදාළව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නීති රීති වලට එකඟව සිදු කරනු ලබයි.

17. කිසියම් විද්‍යාලයක පවත්වන පාඨමාලාවක් (පළමු/දෙවන/තෙවන) වසර සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවල දී ලියාපදිංචි වී ඇති බහුතර සිසුන් සංඛ්‍යාව සිටින අදාල පාඨමාලාව සහිත ආසන්නතම විද්‍යාලය සමඟ ඒකාබද්ධ කිරීම හෝ එම පාඨමාලාව පැවැත්වෙන වෙනත් ආසන්නතම තාක්ෂණ/කාර්මික විද්‍යාලයකට යොමු කිරීම කරනු ලැබේ.

18. අර්ධ කාලීන පාඨමාලාවක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්,

I. අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරත වන බව තහවුරු කිරීම සඳහා පිළිගත් සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

II. එසේ නොවන්නේ නම් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක NVQ Circular :- 05/2022 ට අනුව අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතු ය. (මෙය අදාළ වන්නේ විශේෂයෙන්ම අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතවීම අවශ්‍ය නොවන පාඨමාලා සඳහා පමණි)

19. සිසුන් අවසන් විභාගය සහ ඇගයීම් සඳහා සුදුසුකම් ලැබීමට, දේශන හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා 75% සහභාගීවීම අනිවාර්ය වන අතර අවම වශයෙන් අඛණ්ඩ ඇගයීම්වල දී සාධන මට්ටම උපයාගෙන තිබීම අත්‍යවශ්‍ය වේ. එසේ නොවන අවස්ථාවල දී අවසන් විභාග හා ඇගයීම් සඳහා පෙනී සිටීමට අවස්ථාවක් හිමි නොවේ.

20. පාඨමාලා කේතයන් BSC, ECC, ETC, ESC, MCC පාඨමාලා සඳහා මෙම දෙපාර්තමේන්තුව මගින් අවසන් විභාගයක් පවත්වා දෙපාර්තමේන්තු සහතිකයක් නිකුත් කරනු ලැබේ. NVQ 5/6 ඩිප්ලෝමා පාඨමාලා සඳහා සමාසික විභාග පවත්වා ඉන් සමත්වන සිසුන් NVQ අවසන් ඇගයීම් සඳහා යොමුකරනු ලැබේ.

21. දෙපාර්තමේන්තුව මඟින් අවසන් විභාග සඳහා ගාස්තු අය කරන ආකාරය පහත පරිදි වේ.

I. පළමු වරට පෙනී සිටින සිසුන්ගෙන් කිසිදු ගාස්තුවක් අය නොකෙරේ.

Gazette.lk AMBITIONS REALIZED SINCE 2014

II. නැවත විභාගයට පෙනී සිටින(Repeat) සිසුන්ගෙන් හා නැවත ප්‍රතිඵල සමීක්ෂණය (Re-Correction) සිදු කරන සිසුන්ගෙන් එක් විෂයයකට NVQ Level 3/4 සඳහා රුපියල් දෙසියක මුදලක් ද NVQ Level 5/6 සඳහා රුපියල් තුන්සියයක මුදලක් ද අය කරනු ලැබේ.

22. මෙම *ගැසට් පත්‍රයෙහි* සඳහන් තාක්ෂණ විද්‍යාලවල සහ කාර්මික විද්‍යාලවල 2027 අධ්‍යයන වර්ෂයෙහි පැවැත්වීමට නියමිත පාඨමාලා සියල්ලම පැවැත්වීම හෝ කිහිපයක් පැවැත්වීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි වේ.

23. ගාස්තු අයකිරීමට යටත් කෙටි කාලීන (විශේෂ) පාඨමාලා විද්‍යාල විසින් හඳුන්වා දෙනු ලැබේ. ඔබට එම පාඨමාලා පිළිබඳ වැඩිදුර විස්තර ආසන්නයේ පිහිටි තාක්ෂණ විද්‍යාලයේ/ කාර්මික විද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයෙන් ලබා ගත හැක.

24. සිංහල, ඉංග්‍රීසි, දෙමළ ගැසට් පත්‍ර අතර වෙනසක් ඇතොත් සිංහල ගැසට් පත්‍රය බලාත්මක වේ.

**ඩී.වත්සලා මාරඹගේ,**
අධ්‍යක්ෂ ජනරාල්.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 557,
ඕල්කොට් මාවත, කොළඹ 10.
www.dtet.gov.lk

**තාක්ෂණ / කාර්මික විද්‍යාල ලැයිස්තුව**

| *අනු. අංකය* | *තාක්ෂණ / කාර්මික විද්‍යාලය* | *ලිපිනය* | *දුරකථන අංකය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|
| 01 | අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලය | ඉහිනියාගල පාර, අම්පාර. | 063-2223485<br>063-2224236 | අම්පාර |
| 02 | අනුරාධපුරය තාක්ෂණ විද්‍යාලය | විද්‍යාල මාවත, අනුරාධපුරය. | 025-2222690<br>025-2224710 | අනුරාධපුරය |
| 03 | බදුල්ල තාක්ෂණ විද්‍යාලය | ග්‍රීන්ලේන් ඩ්‍රයිව්, බදුලුපිටිය,බදුල්ල. | 055-2222413<br>055-2230550<br>055-2220413 | බදුල්ල |
| 04 | ගාල්ල තාක්ෂණ විද්‍යාලය | කළුවැල්ල, ගාල්ල. | 091-2234051<br>091-2225985 | ගාල්ල |
| 05 | යාපනය තාක්ෂණ විද්‍යාලය | බ්‍රවුන්ස් පාර, යාපනය. | 021-2220028<br>021-2212403 | යාපනය |
| 06 | මහනුවර තාක්ෂණ විද්‍යාලය | අරුප්පල, මහනුවර. | 081-2224063<br>081-2211810 | මහනුවර |
| 07 | කුරුණෑගල තාක්ෂණ විද්‍යාලය | පුත්තලම පාර, කුරුණෑගල. | 037-2223264<br>037-2056069 | කුරුණෑගල |
| 08 | ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය මරදාන | ඕල්කොට් මාවත, කොළඹ 10. | 011-2440352<br>011-2324177 | කොළඹ |
| 09 | රත්නපුර තාක්ෂණ විද්‍යාලය | ෆාම් ගාර්ඩන්, කොළඹ පාර, රත්නපුරය. | 045-2232390<br>045-2224715 | රත්නපුර |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| අනු. අංකය | තාක්ෂණ / කාර්මික විද්‍යාලය | ලිපිනය | දුරකථන අංකය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| 10 | අක්කරෙයිපත්තුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන වීදිය, අක්කරෙයිපත්තුව. | 067-2279326<br>067-2279865 | අම්පාර |
| 11 | ආණමඩුව කාර්මික විද්‍යාලය | නවගත්තේගම පාර, ආණමඩුව. | 032-2263288<br>032-2263299<br>032-2263163 | පුත්තලම |
| 12 | බලපිටිය කාර්මික විද්‍යාලය | දුම්රියපොළ පාර, වඳදූව, බලපිටිය. | 091-2258096<br>091-2255248 | ගාල්ල |
| 13 | බණ්ඩාරවෙල කාර්මික විද්‍යාලය | වැවතැන්න, බණ්ඩාරවෙල. | 057-2222753<br>057-2233754 | බදුල්ල |
| 14 | මඩකලපුව කාර්මික විද්‍යාලය | ප්‍රධාන පාර, මන්චන්තොඩුවායි, මඩකලපුව. | 065-2246557<br>065-2248366<br>065-2248727 | මඩකලපුව |
| 15 | බෙලිඅත්ත කාර්මික විද්‍යාලය | පුවක්දණ්ඩාව, බෙලිඅත්ත. | 047-2243229<br>047-2251255 | හම්බන්තොට |
| 16 | දඹුල්ල කාර්මික විද්‍යාලය | මාතලේ පාර, දඹුල්ල. | 066-2284713<br>066-2284885 | මාතලේ |
| 17 | දෙහිඅත්තකණ්ඩිය කාර්මික විද්‍යාලය | මහවනාවෙල, දෙහිඅත්තකණ්ඩිය. | 027-2250117<br>027-2250262 | අම්පාර |
| 18 | ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය | නෝනාගම පාර, ඇඹිලිපිටිය. | 047-2261037<br>047-2261608 | රත්නපුර |
| 19 | ගම්පහ කාර්මික විද්‍යාලය | වැරැල්ලවත්ත, යක්කල. | 033-2229711<br>033-2222132<br>033-2233253 | ගම්පහ |
| 20 | හසලක කාර්මික විද්‍යාලය | යෝධ ඇල පාර, හසලක. | 055-2257129<br>055-2258950 | මහනුවර |
| 21 | හෝමාගම කාර්මික විද්‍යාලය | ගොඩගම, හෝමාගම. | 011-2855315<br>011-2857133 | කොළඹ |
| 22 | කළුතර කාර්මික විද්‍යාලය | කලමුල්ල, කළුතර. | 034-2227804<br>034-2222325<br>034-2236622 | කළුතර |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *තාක්ෂණ / කාර්මික විද්‍යාලය* | *ලිපිනය* | *දුරකථන අංකය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|
| 23 | කෑගල්ල කාර්මික විද්‍යාලය | කච්චේරි පාර, කෑගල්ල. | 035-2222441<br>035-2223319 | කෑගල්ල |
| 24 | කුලියාපිටිය කාර්මික විද්‍යාලය | පන්නල පාර, කුලියාපිටිය. | 037-2281181<br>037-2281323<br>037-2281271 | කුරුණෑගල |
| 25 | මන්නාරම කාර්මික විද්‍යාලය | පන්නායිවෙඩ්ඩුවන් හන්දිය, මඩුපාර. | 023-3238532 | මන්නාරම |
| 26 | මාතලේ කාර්මික විද්‍යාලය | එම්.සී. පාර, මාතලේ. | 066-2224196<br>066-2224847 | මාතලේ |
| 27 | මාතර කාර්මික විද්‍යාලය | මැද්දවත්ත, මාතර. | 041-2222565 | මාතර |
| 28 | මැදගම කාර්මික විද්‍යාලය | බිබිලේ පාර, මැදගම. | 055-2266113<br>055-2266213 | මොණරාගල |
| 29 | මොණරාගල කාර්මික විද්‍යාලය | සිරිගල, මොණරාගල. | 055-2276167<br>055-2277448 | මොණරාගල |
| 30 | නුවරඑළිය කාර්මික විද්‍යාලය | ජයතිලක මාවත, නුවරඑළිය. | 052-2222658<br>052-2235895 | නුවරඑළිය |
| 31 | පාතදුම්බර කාර්මික විද්‍යාලය | නවයාලතැන්න, කටුගස්තොට. | 081-2499782<br>081-2499024<br>081-2500441 | මහනුවර |
| 32 | පොළොන්නරුව කාර්මික විද්‍යාලය | විද්‍යාපුර, පොළොන්නරුව. | 027-2224429<br>027-2224428 | පොළොන්නරුව |
| 33 | රත්මලාන කාර්මික විද්‍යාලය | ගාලුපාර, රත්මලාන. | 011-2632778<br>011-2626955 | කොළඹ |
| 34 | සම්මන්තුරේ කාර්මික විද්‍යාලය | අම්පාර පාර, සම්මන්තුරේ. | 067-2260933<br>067-2051105<br>067-3133673 | අම්පාර |
| 35 | ත්‍රිකුණාමලය කාර්මික විද්‍යාලය | මිහිඳුපුර, ත්‍රිකුණාමලය. | 026-2223034<br>026-2051513<br>026-2227956 | ත්‍රිකුණාමලය |
| 36 | වවුනියාව කාර්මික විද්‍යාලය | මන්නාරම පාර, නෙලුක්කුලම්, වවුනියාව. | 024-2223664<br>024-2226720 | වවුනියාව |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *තාක්ෂණ / කාර්මික විද්‍යාලය* | *ලිපිනය* | *දුරකථන අංකය* | *දිස්ත්‍රික්කය* |
|---|---|---|---|---|
| 37 | වරකාපොල කාර්මික විද්‍යාලය | අහුරුවැල්ල පාර, වරකාපොල. | 035-2267651<br>035-2268302 | කෑගල්ල |
| 38 | වාරියපොල කාර්මික විද්‍යාලය | හලාවත පාර, වාරියපොල. | 037-2267256 | කුරුණෑගල |
| 39 | වීරවිල කාර්මික විද්‍යාලය | නව නගරය, වීරවිල. | 047-2237064<br>047-2237032 | හම්බන්තොට |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

## තාක්ෂණ විද්‍යාලවල / කාර්මික විද්‍යාලවල පැවැත්වෙන පාඨමාලා පිළිබඳ උපලේඛනය - 2027

ජාතික වෘත්තීය සුදුසුකම් (3/4) මට්ටමේ සහතික පත්‍ර පාඨමාලා (NVQ Level – 3/4)

**කෘෂි කාර්මික වැවිලි හා පශු සම්පත් ක්ෂේත්‍රය**

**පූර්ණ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත් වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 01. | A01S001F4.1 | පැළතවාන් සංවර්ධන සහකාර<br><br>Plant Nursery Development Assistant<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. අ.පොස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>**NVQ මට්ටම් 4**</u><br><br>හසලක, මැදගම, කෑගල්ල, වරකාපොල, අම්පාර, ආණමඩුව, රත්මලාන<br><br><u>දෙමළ මාධ්‍යය</u><br><u>**NVQ මට්ටම් 4**</u><br><br>මඩකලපුව, සම්මන්තුරේ, වවුනියාව |
| 02. | ECC 34 | කෘෂි උපකරණ කාර්මික ශිල්පින් සඳහා වූ සහතිකය<br><br>Certificate for Agricultural Equipment Mechanic<br><br>(G50S008)<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය සමත් වී තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>දෙහිඅත්තකණ්ඩිය<br>මොණරාගල |
| 03. | A01S003F4.3 | ක්ෂේත්‍ර සහකාර (කෘෂිකර්ම)<br><br>Field Assistant (Agriculture)<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. අ.පොස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>අම්පාර,අනුරාධපුරය, වරකාපොල, මාතලේ, මහනුවර, රත්නපුර, බණ්ඩාරවෙල, දඹුල්ල, ඇඹිලිපිටිය, හසලක, කුලියාපිටිය, මොණරාගල, නුවරඑළිය, මැදගම, හෝමාගම, කළුතර, දෙහිඅත්තකණ්ඩිය, කුරුණෑගල, කෑගල්ල, පාතදුම්බර, විරවිල, ගම්පහ පොළොන්නරුව, ආණමඩුව, රත්මලාන, ත්‍රිකුණාමලය |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| අනු. අංකය | පාඨමාලා ක්ෂේත්‍රය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුළත් වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 03. | A01S003F4.3 | | | <u>දෙමළ මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>සම්මන්තුරේ, වව්නියාව අක්කරපත්තුව, යාපනය, මඩකලපුව, මන්නාරම, ත්‍රිකුණාමලය |
| 04. | A01S018F4.0 | ශාක පටක රෝපණ පර්යේෂණාගාර සහකාර<br><br>Plant Tissue Culture Laboratory Assistant<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | **1.** දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස **(සා.පෙළ)** විභාගයෙන් මාධ්‍ය භාෂාව, විද්‍යාව හා ගණිතය ඇතුළුව විෂයයන් හයකින් **(06)** සාමාර්ථය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ **NVQ** 3 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>**NVQ** මට්ටම් 4</u><br><br>කුලියාපිටිය |
| 05. | A01S019F4.0 | මල් වගාව හා භූ දර්ශනකරණ සංවර්ධන සහකාර<br><br>Floriculture and Landscape Development Assistant<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>බණ්ඩාරවෙල, ගම්පහ<br><br><u>දෙමළ මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>සම්මන්තුරේ |
| 06. | ECC 83 | කණිෂ්ඨ අධීක්ෂකවරු සඳහා වූ භූදර්ශනකරණය පිළිබඳ සහතිකය<br><br>Certificate in Landscaping for Junior Supervisors<br><br>(O92S001)<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 03 සුදුසුකම ලබා තිබීම. | <u>**සිංහල මාධ්‍යය**</u><br><u>**NVQ මට්ටම් 4**</u><br><br>**වරකාපොල, කැගල්ල** |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත් වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 07. | O92S001F4.1 | භූ දර්ශකරණ සංවර්ධන සහකාර<br><br>Landscape Development Assistant<br><br>පූර්ණ කාලීන, මාස 03<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 03 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>බදුල්ල, රත්මලාන, කළුතර, විරවිල, කුලියාපිටිය |
| 08. | A01S020F4.0 | කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර<br><br>Agriculture Research and Production Assistant<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් මාධ්‍යය භාෂාව, විද්‍යාව හා ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ **3** සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>ඇඹිලිපිටිය |
| 09 | A01S032F4.0 | ගොවිපල නිලධාරි (නවීන තාක්ෂණික කෘෂිකර්මාන්ත)<br><br>Farm Officer (Smart Agriculture)<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් මාධ්‍යය භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ **3** සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>ගම්පහ, කුලියාපිටිය<br><br><u>දෙමළ මාධ්‍යය</u><br><u>**NVQ මට්ටම් 4**</u><br><br>මන්නාරම |
| 10 | A01S037F4.0 | මීමැසි පාලක<br>Bee Keeper<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>**වරකාපොල** |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**කෘෂිකාර්මික වැවිලි හා පශු සම්පත් ක්ෂේත්‍රය**
**අර්ධ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 11. | O92S001P3.1 | භූ දර්ශකරණ සංවර්ධන සහකාර<br>Landscape Development Assistant<br>අර්ධ කාලීන, මාස 06 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 3**<br><br>බදුල්ල, රත්මලාන |

**මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු ක්ෂේත්‍රය**
**පූර්ණ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත් වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 12. | ECC 18 | ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (මෝටර් වාහන ශිල්පී)<br><br>National Certificate in Engineering Craft Practice (Motor Vehicle Mechanic)<br><br>(G50S003)<br><br>පූර්ණ කාලීන, අවුරුදු 02<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍යය භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, මහනුවර, මාතර, කුරුණෑගල, මරදාන, රත්නපුර,බෙලිඅත්ත, දඹුල්ල, ගම්පහ, හසලක, හෝමාගම, කළුතර, කෑගල්ල, කුලියාපිටිය, නුවරඑළිය, රත්මලාන, වරකාපොල, ඇඹිලිපිටිය, බණ්ඩාරවෙල, මාතලේ, මොණරාගල<br><br>ගම්පහ කාර්මික විද්‍යාලයේ පමණක් මෙම පාඨමාලාව සඳහා පෙ.ව.8.00 සිට ප.ව.4.00 දක්වා සහ ප.ව.2.00 සිට ප.ව.8.00 දක්වා කණ්ඩායම් දෙකක් (02) සඳහා සිසුන් බඳවා ගැනේ.<br><br>**දෙමළ මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>මඩකලපුව, මාතලේ |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත් වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 13. | G50S003F3.4 | මෝටර් වාහන කාර්මික ශිල්පි<br><br>Automobile Mechanic<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 3**<br><br>වරකාපොල, ඇඹිලිපිටිය<br><br>**දෙමළ මාධ්‍යය**<br>**NVQ මට්ටම් 3**<br><br>වව්නියාව |
| 14. | G50S003MF4.4 | මෝටර් වාහන කාර්මික ශිල්පි<br><br>Automobile Mechanic<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 ½<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>අම්පාර, අනුරාධපුරය, මහනුවර, කුරුණෑගල, රත්නපුර, ආණමඩුව, කළුතර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය , බෙලිඅත්ත, කෑගල්ල, වාරියපොල, බණ්ඩාරවෙල, විරවිල, මාතර, මාතලේ, මරදාන, හසලක,රත්මලාන, ඇඹිලිපිටිය<br><br>**දෙමළ මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>සම්මන්තුරේ, යාපනය, ත්‍රිකුණාමලය, වවුනියාව |
| 15. | G50S003TF4.4 | මෝටර් වාහන කාර්මික ශිල්පි<br><br>Automobile Technician<br><br>පූර්ණ කාලීන, අවුරුදු 02<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො. ස (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍යය භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>කුරුණෑගල, ගාල්ල |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| අනු. අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුළත් වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන නාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 16. | G50S006F3.4 | මෝටර් සයිකල් කාර්මික ශිල්පී<br><br>Motorcycle Mechanic<br><br>පූර්ණ කාලීන, මාස 06 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 3**<br><br>පොළොන්නරුව, වාරියපොල<br><br>**දෙමළ මාධ්‍යය**<br>**NVQ මට්ටම් 3**<br><br>අක්කරෙයිපත්තු |
| 17. | G50S006F4.4 | මෝටර් සයිකල් කාර්මික ශිල්පී<br><br>Motor Cycle Technician<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම් ලබා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>දඹුල්ල, දෙහිඅත්තකණ්ඩිය, අම්පාර, බදුල්ල, ඇඹිලිපිටිය, පානදුම්බර, අනුරාධපුර, ගාල්ල, කුරුණෑගල, මරදාන, ආණමඩුව, බලපිටිය, කළුතර, කෑගල්ල, මාතර, මොණරාගල, නුවරඑළිය, බෙලිඅත්ත, රත්මලාන, ගම්පහ, කුලියාපිටිය, මාතලේ, විරවිල<br><br>ගම්පහ කාර්මික විද්‍යාලයේ පමණක් මෙම පාඨමාලාව සඳහා පෙ.ව.8.00 සිට ප.ව.4.00 දක්වා සහ ප.ව.2.00 සිට ප.ව.8.00 දක්වා කණ්ඩායම් දෙකක් (02) සඳහා සිසුන් බඳවා ගැනේ.<br><br>**දෙමළ මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>යාපනය, වවුනියාව, අක්කරෙයිපත්තු, මඩකලපුව, මන්නාරම |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත් වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 18. | G50S004F4.4 | මෝටර් වාහන පින්තාරු ශිල්පී<br><br>Automobile Painter<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>**NVQ මට්ටම් 4**</u><br><br>කුරුණෑගල, බදුල්ල, කළුතර, කෑගල්ල , වරකාපොල, ගම්පහ<br><br>ගම්පහ කාර්මික විද්‍යාලයේ පමණක් මෙම පාඨමාලාව සඳහා පෙ.ව.8.00 සිට ප.ව.4.00 දක්වා සහ ප.ව.2.00 සිට ප.ව.8.00 දක්වා කණ්ඩායම් දෙකක් (02) සඳහා සිසුන් බඳවා ගැනේ.<br><br><u>දෙමළ මාධ්‍යය</u><br><u>**NVQ මට්ටම් 4**</u><br><br>වවුනියාව |
| 19. | G50S005F3.2 | මෝටර් රථ ටින්කර් කාර්මික<br><br>Automobile Tinker<br><br>පූර්ණ කාලීන, මාස 06 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>**NVQ මට්ටම් 3**</u><br><br>**කුරුණෑගල** |
| 20. | G50S005F4.2 | මෝටර් රථ ටින්කර් කාර්මික<br><br>Automobile Tinker<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම.<br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>**NVQ මට්ටම් 4**</u><br><br>රත්නපුර, රත්මලාන,-කුරුණෑගල, කෑගල්ල, වාරියපොල, ගම්පහ<br><br>ගම්පහ කාර්මික විද්‍යාලයේ පමණක් මෙම පාඨමාලාව සඳහා පෙ.ව.8.00 සිට ප.ව.4.00 දක්වා සහ ප.ව.2.00 සිට ප.ව.8.00 දක්වා කණ්ඩායම් දෙකක් (02) සඳහා සිසුන් බඳවා ගැනේ. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| අනු. අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුළත් වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 21. | G50S002F3.4 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br><br>Automobile Electrician<br><br>පූර්ණ කාලීන, මාස 06 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 3**<br>බදුල්ල, ගාල්ල, හසලක, බණ්ඩාරවෙල, මාතර, ඇඹිලිපිටිය, බෙලිඅත්ත, වරකාපොල, ආණමඩුව, නුවරඑළිය, කෑගල්ල, කුරුණෑගල, කළුතර, රත්මලාන, මහනුවර, පොළොන්නරුව, දඹුල්ල |
| 22. | G50S002EF4.4 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br><br>Automobile Electrical Technician<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01 ½<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා. පෙළ) ගණිතය, විද්‍යාව, හා මාධ්‍යය භාෂාව විෂයය සමඟ විෂයයන් 6 ක් සමත් වී තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ **NVQ** 3 සුදුසුකම් ලබා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>මහනුවර, ගම්පහ, රත්නපුර, කළුතර, කුරුණෑගල, මරදාන, බෙලිඅත්ත<br><br>ගම්පහ කාර්මික විද්‍යාලයේ පමණක් මෙම පාඨමාලාව සඳහා පෙ.ව.8.00 සිට ප.ව.4.00 දක්වා සහ ප.ව.2.00 සිට ප.ව.8.00 දක්වා කණ්ඩායම් දෙකක් (02) සඳහා සිසුන් බඳවා ගැනේ. |
| 23. | G50S001F4.2 | මෝටර් රථ වායුසමන කාර්මික ශිල්පී<br><br>Automobile Air Conditioning Technician<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම් ලබා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>කුලියාපිටිය, කෑගල්ල, ඇඹිලිපිටිය |
| 24. | G50S024F4.1 | මෝටර් රථ, තාපන, සංවාතන, වායුසමන හා ශීතකරණ තාක්ෂණ ශිල්පී<br><br>Automobile HVACR Technician<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම් ලබා තිබීම. | **සිංහල මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>රත්මලාන, කුරුණෑගල, මරදාන, රත්නපුර, ගම්පහ, හෝමාගම, මාතර, ගාල්ල, බෙලිඅත්ත, කළුතර<br><br>**දෙමළ මාධ්‍යය**<br>**NVQ මට්ටම් 4**<br><br>සම්මන්තුරේ |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| අනු. අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුළත් වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 25. | G50S007F4.3 | ත්‍රිරෝද රථ අලුත්වැඩියා කාර්මික ශිල්පී<br><br>Three Wheeler Technician<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>දෙහිඅත්තකණ්ඩිය, ඇඹිලිපිටිය, වරකාපොල, වාරියපොල, පාතදුම්බර, බණ්ඩාරවෙල, කුලියාපිටිය, මාතලේ, හසලක, බදුල්ල, අනුරාධපුරය, ආණමඩුව<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>මන්නාරම |
| 26. | G52S005F4.0 | මෝටර් රථ තාක්ෂණික අලෙවි සහකාර<br><br>Automobile Techno Commercial Sales Assistant<br><br>පූර්ණ කාලීන, මාස 09<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1.දෙවරකට නොවැඩි වාර ගණනක දී මාධ්‍යය භාෂාව හා ගණිතය ඇතුළුව අ.පොස.(සා.පෙළ) විභාගයේ විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම;<br>*හෝ*<br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>රත්මලාන |
| 27. | G50S009F4.3 | මෝටර් බෝට්ටු එන්ජින් කාර්මික ශිල්පී<br><br>Outboard Motor Technician<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. අ.පොස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>ගාල්ල<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>සම්මන්තුරේ |

**මෝටර් වාහන අළුත්වැඩියාව හා නඩත්තු ක්ෂේත්‍රය**
**අර්ධ කාලීන පාඨමාලා**

| අනු. අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුළත්වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 28. | G50S004P4.4 | මෝටර් වාහන පින්තාරු ශිල්පී<br><br>Automobile Painter<br><br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br>*හෝ*<br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>බදුල්ල |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| අනු. අංකය | පාඨමාලා කේතය | පාඨමාලාවේ නම හා ස්වභාවය | ඇතුළත්වීමේ සුදුසුකම් | පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල |
|---|---|---|---|---|
| 28. | G50S004P4.4 | | 1. අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුක්තව සිටිය යුතු ය;<br><br>*හෝ*<br><br>අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතු ය. | |
| 29. | G50S002P3.4 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී<br>Automobile Electrician<br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 3</u><br><br>බදුල්ල<br>රත්මලාන |
| 30. | G50S006P4.4 | මෝටර් සයිකල් කාර්මික ශිල්පී<br>Motor Cycle Technician<br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම් ලබා තිබීම.<br><br>2. අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුක්තව සිටිය යුතු ය.<br><br>*හෝ*<br><br>අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතුය. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>බදුල්ල |
| 31. | G50S007P4.3 | ත්‍රිරෝද රථ අලුත්වැඩියා කාර්මික ශිල්පී<br>Three Wheeler Technician<br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම් ලබා තිබීම.<br><br>2. අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුක්තව සිටිය යුතු ය;<br><br>*හෝ*<br><br>අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතු ය. | <u>සිංහල මාධ්‍යය</u><br><u>NVQ මට්ටම් 4</u><br><br>බදුල්ල |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 32. | G52S005P4.0 | මෝටර් රථ තාක්ෂණික අලෙවි සහකාර<br><br>Automobile Techno Commercial Sales Assistant<br><br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී මාධ්‍යය භාෂාව හා ගණිතය ඇතුළුව අ.පොෂ. (සා.පෙළ) විභාගයේ විෂයයන් හයකින් (06) සාමාර්ථය ලබා තිබීම.<br><br>2. අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුක්තව සිටිය යුතු ය.<br><br>*හෝ*<br><br>අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතු ය. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>ගම්පහ |

**සම්භාණ්ඩ හා පාවහන් ක්ෂේත්‍රය**
**පූර්ණ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 33. | D19S001F4.3 | පාවහන් නිමැවුම් ශිල්පී<br><br>Footwear Technician<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>ඇඹිලිපිටිය, මැදගම, ගාල්ල |

**ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය**
**පූර්ණ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 34. | ETC 24 | ඉංජිනේරු සැලසුම් ශිල්පය පිළිබඳ ජාතික සහතිකය<br><br>National Certificate in Engineering Draughtsmanship (F45S009) | 1. එක් වරක දී අ.පොෂ (සා.පෙළ) විභාගයේ ගණිතය ඇතුලුව විෂයයන් තුනක් (3) ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විද්‍යාව හා මාධ්‍යය භාෂාව ඇතුලුව විෂයයන් හයකින් (6) සමත් වී තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>අම්පාර, අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, මහනුවර, කුරුණෑගල, රත්නපුර, බලපිටිය, බණ්ඩාරවෙල, බෙලිඅත්ත, දඹුල්ල, |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 34. | ETC 24 | පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | (අ.පො.ස (උ.පෙළ) ගණිතය / ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව හදාරා ඇති අපේක්ෂකයින් කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.) | ඇඹිලිපිටිය, ගම්පහ, හසලක, කළුතර, කෑගල්ල, කුලියාපිටිය, මාතර, වීරවිල, පාතදුම්බර, මොණරාගල, නුවරඑළිය, මරදාන, පොළොන්නරුව, රත්මලාන, වරකාපොල, හෝමාගම, මාතලේ<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>යාපනය, අක්කරෙයිපත්තු, වවුනියාව, මඩකලපුව, සම්මන්තුරේ, ත්‍රිකුණාමලය මරදාන |
| 35. | E41S001F3.5 | ජලනල ශිල්පී<br><br>Plumber<br><br>පූර්ණ කාලීන, මාස 06 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>දෙහිඅත්තකණ්ඩිය, මොණරාගල, හසලක, ගාල්ල, බෙලිඅත්ත, වරකාපොල, වාරියපොල, ඇඹිලිපිටිය<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>වවුනියාව, ත්‍රිකුණාමලය, මන්නාරම |
| 36. | E41S001F4.5 | ජලනල කාර්මික ශිල්පී<br><br>Plumber<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>ඇඹිලිපිටිය, අම්පාර, මහනුවර, පොළොන්නරුව, රත්මලාන, ත්‍රිකුණාමලය<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>යාපනය, අක්කරෙයිපත්තු, මඩකලපුව, සම්මන්තුරේ, වවුනියාව |
| 37. | ECC 82 | ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (කර්මාන්ත ජලනල ශිල්පී)<br>National Certificate in Engineering Craft Practice (Industrial Plumber)<br>(E41S002)<br>පූර්ණ කාලීන, අවුරුදු 01<br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. අ.පො.ස. (සා.පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>මරදාන, රත්නපුර, මාතර, රත්මලාන |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන නාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 38. | ECC 81 | ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (ජලනල)<br><br>National Certificate in Engineering Craft Practice (Plumbing)<br><br>(E41S001)<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>අනුරාධපුරය, කෑගල්ල, කුලියාපිටිය, හෝමාගම, බදුල්ල, ගම්පහ, කුරුණෑගල, බණ්ඩාරවෙල, කළුතර, දඹුල්ල, නුවරඑළිය, වරකාපොල, ගාල්ල, ඇඹිලිපිටිය |
| 39. | ECC 14 | ඉංජිනේරු ශිල්පීය පුහුණුව පිළිබඳ ජාතික සහතිකය - (ගොඩනැගිලි ඉදිකිරීම් ශිල්පි)<br><br>National Certificate in Engineering Craft Practice (Building Craftsman)<br><br>(F45S005)<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>බදුල්ල, බණ්ඩාරවෙල |
| 40. | F45S001F3.3 | කම්බි නැවුම්කරු<br><br>Bar Bender<br><br>පූර්ණ කාලීන, මාස 03 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>**රත්මලාන** |
| 41. | F45S005F4.3 | ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු)<br><br>Construction Craftsman (Masonry)<br><br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br>*හෝ*<br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>බණ්ඩාරවෙල<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>සම්මන්තුරේ |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 42. | F45S005F3.3 | ඉදිකිරීම් ශිල්පි (පෙදරේරු)<br><br>Construction Craftsman (Masonry)<br><br>පූර්ණ කාලීන, මාස 06 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>නුවරඑළිය, රත්මලාන, වරකාපොල, දෙහිඅත්තකණ්ඩිය, බදුල්ල |
| 43. | F45S003F4.4 | ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පි<br><br>Aluminium Fabricator<br>පූර්ණ කාලීන, මාස 06<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම් ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>බණ්ඩාරවෙල, රත්නපුර, ඇඹිලිපිටිය, නුවරඑළිය, රත්මලාන, මහනුවර, හෝමාගම, වරකාපොල, කුලියාපිටිය, මරදාන, අනුරාධපුරය, කුරුණෑගල, කළුතර , බලපිටිය,මාතර, කෑගල්ල, වාරියපොල බදුල්ල, ගම්පහ, මාතලේ<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>යාපනය, මඩකලපුව, අක්කරේපත්තුව, සම්මන්තුරේ |
| 44. | F45S003F3.4 | ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පි<br><br>Aluminium Fabricator<br><br>පූර්ණ කාලීන, මාස 04 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>ආණමඩුව, මොණරාගල<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>ත්‍රිකුණාමලය |
| 45. | F45S019F4.0 | ඇළුමිනියම් පිරිසකරකරණය සහ අභ්‍යන්තර ගෘහ අලංකරණ ශිල්පී<br><br>Aluminium Fabrication with Interior Decoration<br>පූර්ණ කාලීන, අවුරුදු 01<br>කර්මාන්තගත පුහුණුව මාස 06 කි. | 1. අ.පො.ස (සා.පෙළ) දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම් ලබා තිබීම. | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>ගාල්ල |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 46. | ECS 25 | සහකාර ප්‍රමාණ සමීක්ෂක<br><br>Certificate for Quantity Survey Assistants<br><br>(F45S007)<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව හා මාධ්‍යය භාෂාව ඇතුලුව විෂයයන් (06) හයකින් සමත් වී තිබීම | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>අම්පාර, බදුල්ල, ගාල්ල, මහනුවර, බලපිටිය, ගම්පහ, කෑගල්ල, ඇඹිලිපිටිය, මාතර මරදාන, අනුරාධපුරය, රත්නපුර, බෙලිඅත්ත, ගම්පහ, කෑගල්ල, රත්මලාන, වරකාපොල<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>යාපනය, අක්කරෙයිපත්තු, මඩකලපුව, සම්මන්තුරේ, මන්නාරම |
| 47. | F45S018F4.1 | බහුකාර්ය ඉදිකිරීම් ශිල්පි (ඉදිකිරීම්)<br><br>Multi Skilled Technician (Civil)<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br>(මෙම පාඨමාලාව යටතේ ලී වැඩ, ජලනල, පෙදරේරු සහ විදුලි යන ක්ෂේත්‍රයන් ආවරණය වේ.)<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>බලපිටිය, මහනුවර, ගාල්ල, ගම්පහ, රත්මලාන, මරදාන<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>මඩකලපුව, යාපනය, සම්මන්තුරේ |
| 48. | ECC 78 | ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂකවරුන් සඳහා වූ ජාතික සහතිකය<br><br>National Certificate for Construction Site Supervisors<br><br>(F45S006)<br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව<br>මාස 06 කි. | 1. දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව හා මාධ්‍යය භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වී තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම | **<u>සිංහල මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>අනුරාධපුරය, බදුල්ල, ගාල්ල, මහනුවර, කුරුණෑගල, මරදාන, රත්නපුර, බලපිටිය, දඹුල්ල, ඇඹිලිපිටිය, ගම්පහ, හසලක, හෝමාගම, කළුතර, මාතලේ, මොණරාගල, පොළොන්නරුව, වරකාපොල, කුලියාපිටිය, නුවරඑළිය,කෑගල්ල, මාතර, පාතදුම්බර, ආණමඩුව<br><br>**<u>දෙමළ මාධ්‍යය</u>**<br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>වවුනියාව, මන්නාරම, මඩකලපුව, යාපනය, අක්කරේපත්තුව, ත්‍රිකුණාමලය, සම්මන්තුරේ |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 49. | F45S006F4.4 | ඉදිකිරීම් ක්ෂේත්‍ර පරීක්ෂක<br><br>Construction Site Supervisor<br><br>පූර්ණ කාලීන, අවුරුදු 01<br><br>රැකියාගත පුහුණුව මාස 06 කි. | 1. අ.පොස. සා.පෙළ දක්වා අධ්‍යාපනය හදාරා තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම | <u>සිංහල මාධ්‍යය</u><br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>දෙහිඅත්තකණ්ඩිය, බෙලිඅත්ත<br>අම්පාර, රත්මලාන, වීරවිල, කුරුණෑගල |

**ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය**
**අර්ධ කාලීන පාඨමාලා**

| *අනු. අංකය* | *පාඨමාලා කේතය* | *පාඨමාලාවේ නම හා ස්වභාවය* | *ඇතුළත්වීමේ සුදුසුකම්* | *පාඨමාලා මාධ්‍යය / NVQ මට්ටම සහ පැවැත්වෙන තාක්ෂණ විද්‍යාල / කාර්මික විද්‍යාල* |
|---|---|---|---|---|
| 50. | F45S003P4.4 | ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී<br><br>Aluminium Fabricator<br><br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. 9 ශ්‍රේණිය සමත් වී තිබීම;<br><br>*හෝ*<br><br>අදාළ ක්ෂේත්‍රයේ NVQ 3 සුදුසුකම ලබා තිබීම.<br><br>2. අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නියුක්තව සිටිය යුතු ය.<br><br>*හෝ*<br><br>අවසාන විභාගයට පෙර අදාළ ක්ෂේත්‍රයේ මාස 06 ක රැකියා පුහුණුවක් ලබා තිබිය යුතු ය. | <u>සිංහල මාධ්‍යය</u><br>**<u>NVQ මට්ටම් 4</u>**<br><br>බදුල්ල, මහනුවර |
| 51. | F45S005P3.3 | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)<br>Construction Craftsman (Masonry)<br><br>අර්ධ කාලීන,මාස 06 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>බදුල්ල |
| 52. | E41S002P3.1 | කර්මාන්ත ජලනල ශිල්පී<br><br>Industrial Plumber<br><br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම | <u>සිංහල මාධ්‍යය</u><br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>රත්මලාන |
| 53. | E41S001P3.5 | ජලනල ශිල්පී<br><br>Plumber<br><br>අර්ධ කාලීන, අවුරුදු 01 | 1. 09 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදාරා තිබීම. | <u>සිංහල මාධ්‍යය</u><br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>බදුල්ල, මහනුවර, රත්මලාන<br><br><u>දෙමළ මාධ්‍යය</u><br>**<u>NVQ මට්ටම් 3</u>**<br><br>මඩකලපුව |

